
# මකර ගෙඩිය ඩ්‍රැගන් පෲට්



පී ප්‍රහර්ෂ කේ පොන්සේකා

# මකර ගෙඩිය ඩ්‍රැගන් පෘට්

ජී ප්‍රහර්ෂ කේ පොන්සේකා

කතෘ

පළමු දිගහැරුම

මහ/කිංස්වුඩ් විදුහල

3ශ්‍රේණිය

2025.02.08

ISBN – 978-624-208-751-1

# පිදුම

## ගස්වැල් වලට ආදරය කරන
## මගේ යාළුවන්ට

# පෙරවදන

සාහිත්‍ය දියුණුව රටක සංවර්ධනය මනින මිනුම් දණ්ඩකි.ලක් ඉතිහාසයේ කෝට්ටේ, දඹදෙණි යුග කැපී පෙනෙන්නේ ද සාහිත්‍යමය වශයෙන් ප්‍රබෝධවත් කාලපරිච්ඡේද නිසාය. එසේ නම් මහමායා ඉතිහාසයේ ද සාහිත්‍යමය වශයෙන් ස්වර්ණමය අවධිය මෙයයි. දැනට වසර ගණනාවක සිට අපගේ දියණියන් ග්‍රන්ථකරණය තුළින් විස්කම් පෑම එයට හේතුවයි. පාසල තුළ පොත් ලියන සංස්කෘතියක් ගොඩ නගා එය රටේම පාසල් පද්ධතියට ව්‍යාප්තකර මෙවර ගෝලීය ශිෂ්‍ය ප්‍රජාව ම ඊට සම්බන්ධ කර ගැනීමය අප ගත්කතුවරියන් සමත්වීම සුවිශේෂ සිදුවීමකි.

ඉන් ඔබ්බට යමින් මෙවර පාසල් ප්‍රජාවම ආදී කතෘ කරදන අත්ථදස්සි මාහිමිපාණන් වහන්සේට උපහාර පිණිස අතීත යතිවර ලේඛබ සම්ප්‍රදාය රට තුළ යළි ගොඩනගන්නට පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද ග්‍රන්ථකරණයට යොමු කරන හෙරණගත්කරණී ව්‍යාපෘතිය හඳුන්වා දෙන්නට විය. මෙම ශාස්ත්‍රීය සහ ශාසනික සේවාවෙන් රටේ පාසල් අධ්‍යාපනයේ සහ පිරිවෙන් අධ්‍යාපනයේ ගුණාත්මක වෙනසක් ඇතිකරන්නට නායකත්වය දීමට ලැබීම එහි විදුහල්පතිනිය වශයෙන් මා හට අභිමානයක් වන අතරම පාසලක් වශයෙන් ලබන ජයග්‍රහණයක් ද වෙයි. ජීවිතයේ මුල් අවධියේ ම තම සහජ කුසලතාව හඳුනාගනිමින් ලේඛණ කරණයට යොමුවීම ප්‍රතිඵලයක් ලෙස එළිදකින මෙම කෘතිය ඉදිරි අධ්‍යාපනය සඳහා මෙන්ම අනාගත දිවිය සඳහා අත්වැලක් වනු නො අනුමානය.

විදුහල්පතිනිය,

ශශිකලා සේනාධීර,

මහමායා බාලිකා විද්‍යාලය- මහනුවර.

# පටුන


- හැඳින්වීම
- ක්‍රමවේදය
- නිරීක්ෂණ
- නිගමන
- අත්දැකීම් හා ලබාගත් දැනුම
- ගැටලු හා විසඳුම්
- අනාගත සැලසුම්
- පරිසරය සුරැකීමේ වටිනාකම ගැන මට හිතෙන දේ

# හැඳින්වීම

අපේ අල්ලපු ගෙදර අත්තම්මා අවුරුදු ගානකට කලින් ඩ්‍රැගන් ෆෲට් පැළයක් පැල කලා. මමයි අයියයි හැමදාම ගහ දිහා බලාගෙන හිටියා ඒකේ ගෙඩියක් හැදෙයි කියලා.අහම්බෙන් දැක්ක මල් පොහොට්ටුවෙන් ගෙඩියක් හැදෙනකල් මං පැළය ගැන නිරීක්ෂණය කළා.

අයියයි මමයි ගෙදර පතොක් පැළ වගා කරනවා.ඩ්‍රැගන් ෆෲට් පැළයත් පතොක් වර්ගයක් කියලා දැනගත්ත දවසේ ඉඳන් මේ පැලය ගැන සොයා බලන්න ආසා වීම හේතු වුණා.

## ක්‍රමය

සති හයක් තිස්සේ ඩ්‍රැගන් පෲට් පොහොට්ටුව වෙනස් වෙන ආකාරය හා ගෙඩිය හැදෙන ආකාරය දිනපතා නිරීක්ෂණය කිරීම.

## නිරීක්ෂණයට යොදා ගත් උපකරණ

- ❖ දුරදක්නය
- ❖ අත්කාචය
- ❖ මිනුම් පටිය
- ❖ හිස පලදන විදුලි පන්දම

## තොරතුරු සොයා ගත් හැටි

- ❖ අත්තම්මලාගෙන්
- ❖ ගුරුවරුන්ගෙන්
- ❖ අන්තර්ජාලයෙන්
- ❖ පෝන්වලින්


# අමුතු මලක්

| | | | |
|---|---|---|---|
| දිනය | 2023.07.16 | ස්ථානය | අල්ලපු ගෙදර වත්ත |
| කාලය | හවස 5.30 | කාලගුණය | වියලි |




එක දවසක් මම අල්ලපු ගෙදර වත්තට යනකොට එහේ ක්ලබ් එක උඩ තිබුණු ඩ්‍රැගන් ෆෲට් පැළයේ මං කවදාවත් දැකලා නැති මලක් පිපිලා තිබුණා.

මං දුවලා ඇවිත් අම්මට ඒක කිව්වා.ඊට පස්සේ මමයි අම්මායි අල්ලපු ගෙදරට ගිහින් එහේ අත්තම්මාගෙන් මල ගැන විස්තර ඇහුවා.



| | |
|---|---|
| මම | කවදා ද මේ මල පිපුණේ? |
| අත්තම්මා | සතියක් හමාරක් විතර ඇති මගේ හිතේ. |
| මම | මේක ඇත්තටම ඩ්‍රැගන් ෆෲට් මලක් ද? |
| අත්තම්මා | ඔව් පුතේ මේ පැළේ හදලා දැනට අවුරුදු 6ක් විතර වෙනවා.මේක තමා හැදුන පළවෙනිම පොහොට්ටුව |
| මම | මේක පොහොට්ටුවක්නේ දැන්නේ තේරුනේ |

# පොහොට්ටුව ලොකු වෙලා

| | | | |
|---|---|---|---|
| දිනය | 2023.07.18 | ස්ථානය | අල්ලපු වත්ත |
| කාලය | හවස 8.00 | කාලගුණය | වියළි |




මම මළ කියලා හිතපු පොහොට්ටුව අද ටිකක් ලොකු වෙලා. මම කවදාවත් දැකලා නැති මලක් නිසා අපේ වත්තේ ඉඳන් පොහොට්ටුව දිහා විටින් විට බැලුවා.


මට මතකයි අම්මා මට කියලා තියෙනවා කඩුපුල් මල් පිපෙන්නේ රෑට කියලා.අපි එක දවසක් රෑ මැද වෙනකම් ඇහැරලා ඉඳලා කඩුපුල් මල් පිපෙනවා බැලුවා.ඩ්‍රැගන් ෆෲට් පැලෙත් කඩුපුල් වර්ගයක් ද කියලා මට හිතුනා.ඊට පස්සේ මම අම්මත් එක්ක විස්තර හෙව්වා.

- ❖ කඩුපුල් හා ඩ්‍රැගන්ෆෲට් යන දෙකම පතොක් වර්ග වේ.
- ❖ ඒවා උෂ්ණ ප්‍රදේශවල හොඳින් වැවේ.
- ❖ මේවායේ මල් රෑට පිපේ.

# පිපුණු මල

දිනය 2023.07.19 ස්ථානය අල්ලපු වත්ත

කාලය පාන්දර 5.00




රෑ විටින් විට බැලුවට ඩ්‍රැගන් පෲට් පොහොට්ටුව හරියටම මලක් වෙලා තිබුණේ නැහැ. ඒත් උදේ බලද්දි මල හොදට පිපිලා. මට හරිම පුදුමයි. ඒ මල ගොඩක් ලොකුයි.පෙතිත් ගොඩාක් තියෙනවා.කූඹියෝ මී මැස්සෝ එහි සිටියා.

# පැළේ හා මලේ විස්තර

දිනය 2023.07.19 ස්ථානය අල්ලපු වත්ත

කාලය හවස 5.00 කාලගුණය වියළි

- ❖ අපේ රටේ භාවිතා වන නම - ඩ්‍රැගන් ෆෲට්
- ❖ ඉංග්‍රීසි නම - **Dragon fruit**
- ❖ විද්‍යාත්මක නම - **Hylocerus undatus**
- ❖ ගහ ඇති තැන - මහනුවර ප්‍රිම්රෝස් උයන

මල ලොකුයි. පෙති සුදු පාටයි. මැද කහ පාටයි. කඩුපුල්වලට සමානයි. මල හරිම ලස්සන නිසා නිශා රැජින යැයි හඳුන්වයි.

අමු ගෙඩි කොළ පාටයි.ඉදුණු ගෙඩියේ පොත්ත රතු පාටයි.

# මල පරවෙලා

දිනය 2023.07.20 ස්ථානය අල්ලපු වත්ත

කාලය හවස 6.00 කාලගුණය වියළි



ඊයේ මල හොඳට පිපිලා තිබුණ නිසා මම අද මල දිහා තවත් හවස් වෙනකම් බලන් හිටියා.බලද්දි මල පරවෙලා.මට හරිම දුකයි. ඒත් මලේ හිටිය කූඹියෝ හිතින් නැහැ.ඒත් පල පර වුණාම කූඹියෝ මලට ඇවිත් මොනවා ද බොන්නේ පැණි නැතත්.

# ඩ්‍රැගන්ලන්තයට ගිය දවස

දිනය 2023.07.22 ස්ථානය ගන්නොරුව

කාලය හවස 6.00 කාලගුණය අඳුරු

මම ඩ්‍රැගන් පෘට් පොහොට්ටුව බාගයක් පිපිලා තියෙද්දි බලන්න පටන් ගත්තා නිසා අම්මායි මමයි ගන්නෝරුව කෘෂිකර්මයට ගියා.පොහොට්ටුව බලන්න මම ගන්නෝරුවේ කෘෂිකර්මයට ඩ්‍රැගන්ලන්තය කියලා කියන්නේ එහේ තියෙන ඩ්‍රැගන්ලන්තය කියලා කියන්නේ එහේ තියන ඩ්‍රැගන්පෘට් පැළ, පදුරු වගේ ගොඩ ගැහිලා තියෙන නිසා හා ඒවා මකරුන් වගේ දිගට කැරකිලා තියෙන නිසායි. ඒ වගේම ඒ පැළවල තටුත් මකරුන් වගේ.

එහේ තිබූ ඩ්‍රැගන් පෘට් පැළවල මල් පොහොට්ටු මල් ගෙඩි පරවෙච්ච මල්, දිග පොහොට්ටු ලොකු පොහොට්ටු ගොඩාක්

ඩ්‍රැගන් යාළුවෝ - කටුස්සෝ දිනය - 2023.07.22

ස්ථානය ගන්නොරුව කාලය හවස 6.30

කාලගුණය සීතල




මං දැක්කා

ඩ්‍රැගන් පෘට් වගාවේ බොහෝ පොහොට්ටු තිබේ.

කොළ පාටට ගෙඩි බොහෝ කොළ පාටට කටුස්සෝ

කොළ පාට කටුස්සෝ හතරක් දැක්කා.

කටුස්සන්ගේ පාටයි තටු වගේ පෙනුමයි නිසා එයාලව වෙන් කරලා හදුනා ගන්නා අමාරු වුණා.ඒ නිසා අනිත් සත්තුන්ට කටුස්සෝ පේනවා අඩුයි.අම්මා මට කියලා තියෙනවා මේ කටුස්සෝ ඩ්‍රැගන්පෘට් පැල වල විතරක් නෙමේ ඉන්නේ කියලා.මේ කටුස්සන්ට කියන්නේ පළා කටුස්සා කියලා.අම්මා කිව්වා.

පරිසරය අඳුරු වූ නිසා මම හිසේ පලඳින විදුලි පන්දම භාවිතයෙන් ඩ්‍රැගන්පෘට් වගාවේ පැළවල තියෙන හැම කොටසක්ම හොඳින් සෝදිසි කළෙමි.

## ඩ්‍රැගන් බිත්තර තැටි

| | | | |
|---|---|---|---|
| දිනය | 2023.07.25 | ස්ථානය | අල්ලපු වත්ත |
| කාලය | හවස 6.00 | කාලගුණය | වියළි |



අද මම බලනකොට පරවෙච්ච මල ගොඩාක් දුඹුරු පාට වෙලා ඇතුළෙන් පොඩි කොළපාට ගෙඩියක් ඇවිල්ලා. ගෙඩියේ කොළේ පාට තටු වගේ තිබුණා.මට ඒක පෙනුනේ මකරුන් බිත්තරේ නැට්ටක් ඇවිල්ලා වගේ.

# ගෙඩිය ලොකු වෙලා

**දිනය** 2023.07.27 **ස්ථානය** අල්ලපු වත්ත

**කාලය** හවස 5.30 **කාලගුණය** වියළි



මම අද ගෙඩිය දිහා බලද්දි ගෙඩිය ටිකක් මහත්වෙලා.මම අම්මට ඒක කිවුවා.අම්මත් ගිහින් බැලුවා. මම ටිකක් ගෙඩිය ඇවිත් තියෙන විදිහ බැලුවා.ගෙඩියේ වර්ණය ටිකක් තද වෙලා.ගෙඩියේ මහත 15cm ක් වේ.ඒ සදහා මිනුම් පටිය භාවිතා කළා.

# කව්යෙන් විස්තර

| | | | |
|---|---|---|---|
| දිනය | 2023.07.20 | ස්ථානය | අල්ලපු වත්ත |
| කාලය | හවස 6.00 | කාලගුණය | වියළි |

ගෙඩිය තවත් ලොකු වෙලා
පොත්ත තවත් නද වෙලා
මලත් තවත් තද වෙලා
පදුර තවත් බර වෙලා

2023.08.03

අනේ අදත් ලොකු වෙලා
ගෙඩියේ බරත් වැඩි වෙලා
ගෙඩියේ මහත 21cm

2023.08.10

දැන්නම් උපරිම ලොකුයි
පොත්තත් දැන් දම් පාටයි
ගෙඩිය කඩා ගන්න ගියා
අත්තම්මාගෙන් අහලා

අත්තම්මාට භාගයයි - අපේ ගෙදරට භාගයයි. එක් කොටසක් බුදුසාදුට පූජා කෙරුවා.

# පැහිලා, ඉදිලා රසම රසයි - සුදු වෙලා මදේ

| | | | |
|---|---|---|---|
| දිනය | 2023.08.11 | ස්ථානය | අල්ලපු වත්ත |
| කාලය | හවස 5.30 | කාලගුණය | වියළි |



ගෙඩිය කපලා බැලුවම, මදේ සුදු පාටයි. කළු පාට තිත් වගේ ඇට තිබුණා.ඇට හැපෙන කොට හරිම ආසයි.ගෙඩියේ හොදට වතුරත් තියෙනවා.මදේ දම් පාට ගෙඩිත් මම කාලා තියෙනවා.පොත්ත කහ මදේ සුදු ගෙඩිත් තියෙනවා.මේවා ගොඩාක් ගුණයි. අම්මා කිව්වා.

## නිගමන

- ❖ ඩ්‍රැගන් ෆෘට් ශාකය පතොක් වර්ගයකි.
- ❖ ඩ්‍රැගන් ෆෘට් පැළයට පත්‍ර නොතිබේ.
- ❖ මල් රෑට පිපේ.
- ❖ ඩ්‍රැගන් ෆෘට් පැළයේ ගෙඩිය පලතුරක් ලෙස ආහාරයට ගත හැකිය.
- ❖ ඩ්‍රැගන් ෆෘට් ශාකය, පළා කටුස්සාගේ නිවහනක් වේ.
- ❖ ඩ්‍රැගන් ෆෘට් මලෙන් ගෙඩි සෑදෙයි.

මෙමගින් මා ලබාගත් අත්දැකීම් සහ දැනුම

- ❖ ඩ්‍රැගන් ෆෘට් පැළය අමුතු පැළයකි. එහි කොළ නැත.
- ❖ ඩ්‍රැගන් ෆෘට් මලෙන්, ගෙඩියක් හැදෙන හැටි
- ❖ කටුස්සන්ට කූඹියන්ට හා මී මැස්සන්ට
- ❖ ඩ්‍රැගන් ෆෘට් පැළය ප්‍රයෝජනවත් වන බව
- ❖ ඩ්‍රැගන් ෆෘට් මල් පිපෙන හැටි හා පරවෙන හැටි
- ❖ විවේක වෙලාවට ගස්වල ලස්සන බැලිය හැකි බව.
- ❖ පොතක් ලියන හැටි දැනගැනීම.

## මෙම අධ්‍යයනයේ දී මම මුහුණ පෑ ගැටලු හා ඒවා විසඳාගත් හැටි


- මම මුලින් දැක්කේ ටිකක් ලොකු වෙලා තිබ්බ පොහොට්ටුව නිසා, පොඩි පොහොට්ටු බැලීමට ගන්නෝරුව කෘෂිකර්මයට යාම.
- මල පිපෙන්නේ මහ රෑ නිසා මය නිදිමත වුණා.පාන්දර ඇහැරලා පිපුණු මල බැලීම.
- අල්ලපු වත්තේ තිබුනේ එක ගෙඩියක් පමණක් නිසා තව ගෙඩි බැලීමට ගන්නෝරුව කෘෂිකර්මයට අම්මා සමග යාම.
- ගෙඩියේ මහත හා බර මැනීමට අයියාගේ උදවු ගැනීම.
- පොහොට්ටුව මුලින්ම ආව දවස දැනගෙන තිබුණේ නැති නිසා පහළ අත්තම්මාගෙන් අසා දැන ගැනීම.
- ගෙඩියේ මහත මනින කොට කටු කම්බිය ඇනීම.අම්මාගේ උදව් ගැනීම.

# මගේ අනාගත සැලසුම්

- ඩ්‍රැගන් පෑට් වගාවක් පටන් ගැනීම.
- ලැබෙන ගෙඩි ගුරුතුමියට හා අත්තම්මාට දීම.
- ඩ්‍රැගන් පෑට් වර්ග ගැන, කටුස්සෝ ගැන සෙවීම.
- ඩ්‍රැගන් පෑට් වල **DNA** එක්ක මිනි මවුස් පතොක්වල **DNA** මිශ්‍ර කරලා වෙනම පැළයක් සෑදීම.
- අලුත් නම ඩ්‍රැගන් පැළය

# පරිසරය රැකීමේ වටිනාකම ගැන මට හිතෙන දේ

- පරිසරයේ ගස් කැපුවොත් අපිට හුස්ම ගන්න අමාරු වේ.
- අපිට හෙවන නැති වේ. එතකොට රස්නේ වැඩි වේ.
- කොරෝනා කාලයේ වගේ අපට කෑම අඩු වේ.
- ගස් හා සත්තු රැක ගත්තේ නැත්නම්, අපිට ජීවත් වෙන්න එපා වෙයි.



# පසුවදන



රටේ අනාගත සංවර්ධනයට ඉවහල්වන සාහිත්‍යය ප්‍රබෝධයත් අධ්‍යාපනයේ ගුණාත්මක දියුණුවත් සාහිත්‍ය නිර්මාණකරණය විභවතා කොටගත් අනාගතපරපුරේ හැකියාවන් ඔප්නැංවීම සහ එළිදැක්වීමට වේදිකාවක් ගොඩ නැගීම වැනි බහුවිධ පරමාර්ථ ඇතිව 2014 වසරේ පටන් මාගේ සංකල්පයකට අනුව ක්‍රියාත්මක පාසල් දරුවන් ග්‍රන්ථකරණයට යොමුකරන ක්‍රියාමූලික පර්යේෂණ ව්‍යාපෘතිය යටතේ මේ වන විට ලේඛක අංකුර හැට දහසකට වැඩි ප්‍රමාණයක් දේශීය සාහිත්‍ය කෙතේ රෝපණය කිරීමට ලැබීම අප ලැබූ භාග්‍යයකි. එම බීජ දළුලා වැඩෙන්නට ඇවැසි සරු පසක් සැකසීම සමාජ වගකීමයි. පාසලක් මුල්වීමෙන් අධ්‍යාපනයේ ඵලදායීතාව වෙනුවෙන් වසර ගණනාවක් අඛණ්ඩව පාසල් කලාප, පළාත්, ජාතික සහ ජාත්‍යන්තර තලය දක්වා ක්‍රියාත්මක කර ඇති මෑත ඉතිහාසයේ එකම ව්‍යාපෘතිය මෙයයි.

මෙවර ඒ සඳහා පිරිවෙන් ශිෂ්‍ය භික්ෂූන් වහන්සේලා ද සම්බන්ධ කර ගැනීම විශේෂත්වයකි. මෙහි දී මහමායා බාලිකා විද්‍යාලයේ විදුහල්පතිතුමිය, දියණියන්, ගුරුභවතුන්, දෙමාපියන් සහ ආදී ශිෂ්‍යාවන් දැක් වූ කැප කිරීමට ජාතියේ ප්‍රණාමය හිමිවිය යුතුය. මුද්‍රිත පොත තවමත් අපේ අධ්‍යාපනයේ ප්‍රධාන මෙවලමයි. පොතකින් දරුවෙකුට ලැබෙන ආස්වාදය අන් කිසිවකින්වත් ලබාදිය නොහැකිය. මානව දැනුම ගබඩාකර තැබීමට විවිධ විද්‍යුත් උපාංග භාවිතයට එක්වීමත් සමග දරුවන් එයින් දුරස්වීම අධ්‍යාපනයේ ගුණාත්මකබවට අනර්ථකාරී මෙන්ම සමාජය තුළ විවිධ ගැටලු ප්‍රශ්න නිර්මාණය වීමට හේතු වී ඇති බව පර්යේෂණාත්මකව සනාථ වෙයි. මෙයට පිළියම් වශයෙන් ක්‍රියාත්මක මෙම ව්‍යාපෘතියෙන් වසර ගණනාවක් මුද්‍රිත පොත් රචනාකර ඩිජිටල් තාක්ෂණය යුගයේ ස්මාර්ට් බාල පරම්පරාව නූතන තාක්ෂණය සමග ගලපමින් දැනට වසර දෙකක සිට රටේම පාසල් දරුවන් සමග එක්ව විද්‍යුත් කෘති රචනා කරයි. තම නිර්මාණ ජාත්‍යන්තර පාඨකයන් වෙත ගෙනයාමට මහමායා බාලිකාවියන් ඩිජිටල් වේදිකාවක් ගොඩනගා දී තිබේ. තම නිසග, සාහිත්‍ය නිර්මාණ හැකියාව තුළින් එයට පිවිසි පුංචි ගත්කතුවර ඔබගේ ලේඛන දිවියට මගේ සුභාෂිංසන.

ව්‍යාපෘති නිර්මාතෘ සම්බන්ධීකාරක,

සෙනෙවිරත් මහලේකම්